# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම-2026

# කටුවන ප්‍රාදේශීය සභාව

කටුවන ප්‍රාදේශීය සභාව සඳහා 2026 වර්ෂයට භාණ්ඩ හා සේවා සැපයිය හැකි සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා 2026.01.31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.අදාළ අයදුම්පත් ලියාපදිංචි කරන සැපයුම් හා සේවා අයිතමයන් හා කොන්දේසි www.katuwana.ps.gov.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම-2026

2026 වර්ෂයට පහත දැක්වෙන සැපයුම් හා සේවාවන් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට 2026.01.31 වන දින දක්වා අයදුම්පත් කටුවන ප්‍රාදේශීය සභාවේ “ලේකම්” වන මා විසින් කැඳවනු ලැබේ.සැපයුම්කරුවකු වශයෙන් ලියාපදිංචි වීමේ දී, එක් අයිතමයක් සඳහා රු.575ක ලියාපදිංචි ගාස්තුවක් අය කරනු ලබන අතර, අදාළ ගාස්තු ගෙවීමෙන් එක් අයෙකුට බාණ්ඩයන් කිහිපයක් යටතේ වුව ද, ලියාපදිංචි විය හැකි අතර ලියාපදිංචි වීම සඳහා ඔබ විසින් එවනු ලබන ලියුම්කවරයේ වම් පස ඉහළින් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2026 ලෙස ද සඳහන් කර එවන ලෙස දන්වා සිටිමි.අදාළ අයිතමයන් පහත පරිදි වේ.

## සැපයුම්කරුවන්

1. කාර්යාල ලිපි ද්‍රව්‍ය
2. කාර්යාලීය උපකරණ,කාර්යාල ලී බඩු,වානේ කබඩ්
3. පරිගණක,ප්‍රින්ටර්,ටෝනර් ඇතුළු උපකරණ
4. විදුලි උපකරණ/වීථි පහන්
5. රබර් සීල් සැපයීම
6. වාහන බැටරි, ටයර්,ටියුබ් හා වාහන අමතර කොටස් හා සේවා සැපයීම
7. කොන්ක්‍රීට් කණු සැපයීම, කම්බි කණු, හියුම් පයිප්ප සැපයීම
8. ආහාර සහ සංග්‍රහමය ද්‍රව්‍ය සැපයීම
9. සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ සැපයීම
10. ජල මෝටර් හා ජල උපකරණ සැපයීම
11. කැති, උදළු ඇතුළු වානේ උපකරණ සැපයීම
12. අත් මේස්/බූට්ස්/හෙල්මන්ට්/වැහි කබා ඇතුළු කම්කරුවන් සඳහා උපකරණ
13. ගල්/වැලි/සිමෙන්ති ඇතුළු ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය
14. ACමැෂින් සැපයීම සහ අලුත්වැඩියාව
15. තණකොළ කපන මැෂින් සැපයීම
16. කොසු,ඉදල් සැපයීම
17. ආදාහනාගාරය සඳහා ගෑස් සැපයීම (37.5kg)

## සේවාවන්

1. වාහන ඇතුළුවැඩියා හා සර්විස් සැපයීම
2. ප්‍රවාහන පහසුකම් සැපයීම
3. යතුරු ලියන/රෝනියෝ යන්ත්‍ර/පරිගණක යන්ත්‍ර/අලුත්වැඩියාව හා සේවා සැපයීම
4. නීති කටයුතු සඳහා නීති උපදේශක සේවා
5. මැනුම් කටයුතු
6. අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම
7. සියලුම වර්ගයේ රක්ෂණ සේවා සැපයීම
8. ආරක්ෂක සේවා සැපයීම

9. ගිනි නිවීමේ සේවා සැපයීම
10. උපදෙස් හා උපදේශන සපයන්නන්
11. පුහුණු නුපුහුණු සේවා සැපයීම
12. සභාවේ කොන්ත්‍රාත් කටයුතු සඳහා ලියාපදිංචි වීම
13. සමරුඵලක ඉදි කිරීම

**කොන්දේසි**

1. භාණ්ඩ හා සේවා සඳහා මසක කාලයක් සඳහා ණය පදනමට සැපයීමට එකඟ විය යුතුය.
2. සැපයුම් හා සේවා සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවුව ද, ලියාපදිංචි නොවූ පිළිගත් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ අයිතිය ද, සභාව සතු වේ. අදාළ අයදුම්පත පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ද සභාව සතු වේ.
3. සියලුම සැපයුම් හා සේවා ප්‍රාදේශීය සභාව වෙත හෝ නම් කරනු ලබන ස්ථානයකට ගෙනවිත් භාර දීම කළ යුතුය.
4. දක්වනු ලබන පිරිවිතරවලට අනුව, භාණ්ඩ හා සේවාවන් සැපයීමට අපොහොසත් වන හෝ අප ලබා දෙන ඇණවුමට අනුව, භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන්, ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
5. ඉහත සඳහන් බාණ්ඩය යටතේ ලියාපදිංචි වීම සඳහා ලියාපදිංචි ගාස්තුව සහිතව අදාළ චෙක්පත් හෝ මුදල් ඇණවුමක් 2026.01.31 දිනට පෙර කටුවන ප්‍රාදේශීය සභාව වෙත ගෙවීමෙන් 2026 වර්ෂය සඳහා ලියාපදිංචි විය හැකිය.
6. ඒ සඳහා www.katuwana.ps.gov.lk යන අපගේ වෙබ් අඩවියෙන් ආදර්ශ අයදුම්පතක් ලබාගෙන, එය සම්පූර්ණ කර, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ද, සහිතව මෙම සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.
7. ඔබගේ අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙලෙවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම-2025" යනුවෙන් සඳහන් කළ යුතුය.
8. චෙක්පත් යොමු කිරීමේදි ලේකම්,කටුවන ප්‍රාදේශීය සභාව ලෙස යොමු කරන්න.
9. වැඩි විස්තර කාර්යාලීය දුරකථන අංක 0472247275 විමසීමෙන් ලබා ගත හැකිය.

සභාපති,,
කටුවන ප්‍රාදේශීය සභාව,
මිද්දෙනිය.
2025.11.17

<u>**කටුවන ප්‍රාදේශීය සභාව**</u>

<u>**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය - 2026**</u>

01.පුද්ගල/ව්‍යාපාර නාමය :- ....................................................................................................

02.පුද්ගල/ව්‍යාපාර ලිපිනය :- ....................................................................................................

03.දූරකථන අංකය :- ....................................................................................................

04.ඊමේල් ලිපිනය :- ....................................................................................................

05.තැපැල් ලිපිනය :- ....................................................................................................

06.ලියාපදිංචි කිරීමට අදහස් කරන අයිතමය හා අංකය :- ....................................................................

....................................................................................................................................................................

07.ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය :- ..........................................................................
(ඡායා පිටපතක් අමුණන්න)

08.ණය පදනම මත සැපයිය හැකි උපරිම කාල සීමාව :- .........................................................................

09.මුදල් ඇණවුම/චෙක්පත් අංකය හා වටිනාකම :- .........................................................................

10.වෙනත් :- ..............................................................................................................................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.ඒ අනුව, අප ආයතනය..........................................................

.......................................................................සඳහා සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි කර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

.....................................
ඉල්ලුම්කරුගේ අත්සන

---

<u>**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**</u>

ලදුපත් අංකය :- ..............................................................
දිනය :- ..............................................................
ලියාපදිංචි කිරීමේ පිටු අංකය :- ..............................................................

| | | |
|---|---|---|
| .................................... | ..................................... | ..................................... |
| විෂයභාර නිලධාරී, | ලේකම්, | සභාපති, |
| කටුවන ප්‍රාදේශීය සභාව, | කටුවන ප්‍රාදේශීය සභාව, | කටුවන ප්‍රාදේශීය සභාව, |
| මිද්දෙනිය. | මිද්දෙනිය. | මිද්දෙනිය. |

ලියාපදිංචි කිරීමේ පිටු අංක :- ....................................